ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
இலங்கைப் பொதுப் பயன்பாடுகள் ஆணைக்குழு
PUBLIC UTILITIES COMMISSION OF SRI LANKA

ඔබේ අංකය
உமது இல
Your No.

අපේ අංකය
எமது இல.
Our No.

දිනය
திகதி
Date

**ප්‍රවෘත්ති නිවේදනය**

(02.06.2022) අ.පො.ස. (සා/පෙ). විභාගය පැවති කාලය තුලදී විභාග කටයුතු වලට බාධාවන පරිද්දෙන් උද්ඝෝෂන හා මාර්ග අවහිර කිරීම් වලින් වැළකෙන ලෙස කල ඉල්ලීමට දැක්වූ සාධනීය ප්‍රතිචාරය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මහජනතාවට සිය ස්තුතිය පල කර සිටී. මාර්ග අවහිර කිරීම් හා උද්ඝෝෂණ වලින් වැලකී මහජනතාව විභාගය සාර්ථකව පවත්වාගෙන යාම සඳහා උපරිම සහාය දක්වා ඇතැයි ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සඳහන් කරයි. විභාග දිනවලදී විදුලි කප්පාදුව අවම කරමින් බාධාවකින් තොරව විභාගය පැවත්වීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව උපරිම ආකාරයෙන් දායක විය. මේ සම්බන්ධයෙන් වැඩිදුර අදහස් දැක්වූ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සභාපති ජනක රත්නායක මහතා.

“විදුලිබල කර්මාන්තයේ නියාමන ආයතනය විදියට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විශාල පරිශ්‍රමයක් දරා විභාග පැවත්වෙන කාලය තුලදී මෙන්ම විභාගය පැවති දිනවල රාත්‍රිකාලයේද විදුලි කප්පාදුවකින් තොරව විදුලිය සැපයීම සඳහා පියවර ගත්තා. විභාග දෙපාර්තමේන්තුවටත්, විභාගයේ රාජකාරි කරන නිලධාරීන්ට, විභාගය පෙනී සිටි ලක්ෂ 5කට අධික සිසුන්ට හා ඒ දෙමාපියන්ට විභාග කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා විදුලි කප්පාදුව අවම ලෙස සිදු කලා. මෙවර විභාගය පැවති කාලයේදී රටේ පැවති නොසන්සුන් තත්වය නිසා ඇතිවිය හැකි මහජන උද්ඝෝෂණ හා පෙලපාලි වලින් ද විභාගයට අවහිරතා ඇතිවීමේ ඉඩකඩ තිබුණා. ඒ නිසා විදුලිය සැපයීම තහරවුරු කිරීමෙන් පමණක් විභාගය බාධාවකින් තොරව පවත්වාගෙන යා නොහැකි බව අප තේරුම්ගත්තා. ඒ නිසා අපි විභාගයට පෙනී සිටි සිසුන් වෙනුවෙන් මහජනතාවගෙන් ඉල්ලීමක් කළා මාර්ග අවහිර කෙරෙන උද්ඝෝෂණ වලින් වළකින ලෙස. ඇත්තෙන්ම විභාග පැවති දිනවල මාර්ග අවහිර කරමින් විභාගය සඳහා ගමනාගමන කටයුතු වල යෙදුන අයට බාධාකිරීමේ සිද්ධි කිසිවක් වාර්තා වුණේ නැහැ. අපි අපේ ස්තුතිය හා කෘතඥතාව පුද කරනවා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ ඉල්ලීමට කන් දෙමින් විභාග දිනවලදී මාර්ග අවහිර කෙරෙන උද්ඝෝෂණ වලින් මහජනතාව වැළකී සිය දූ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් සහාය වීම සම්බන්ධයෙන්”

06 වන මහල, ලංකා බැංකු වෙළඳ කුළුණ, 26, ශාන්ත මයිකල් පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව. | 06 ஆவது மாடி, இலங்கை வங்கி வர்த்தகக் கோபுரம், 28, சென் மைக்கல் வீதி, கொழும்பு 03, இலங்கை. | Level 06, BOC Merchant Tower, 28, St. Michael's Road, Colombo 03, Sri Lanka.

Tel : +94 11 2392607/8 Fax : +94 11 2392641 E-mail : info@pucsl.gov.lk Web : www.pucsl.gov.lk

සභාපති
தலைவர்
Chairman +94 11 2392604

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் நாயகம்
Director General +94 11 2392606